විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

## මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකාවෙන් නේපාලයට ඇමරිකානු ඩොලර් මිලියනයක මානුෂීය ආධාර

ජීවිත හානි, අවතැන්වීම් සහ අතිමහත් විනාශයක් සිදු කළ ව්‍යසනකාරී ගංවතුර සහ නායයෑම් හේතුවෙන් විපතට පත් නේපාල ජනතාව වෙත ශ්‍රී ලංකාව දක්වන සහයෝගීතාව පෙන්නුම් කරමින්, නේපාලයේ අඛණ්ඩ මානුෂීය සහ සහන කටයුතු සඳහා සහාය වීමේ ප්‍රයත්නයක් වශයෙන්, ඇමරිකානු ඩොලර් මිලියනයක මූල්‍ය ආධාරයක් ලබා දෙන ලෙස අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා රජයට උපදෙස් දී තිබේ.

මෙම ඛේදජනක ජීවිත හානි සහ ව්‍යසනයෙන් ඇති වූ පීඩාකාරී තත්ත්වය සම්බන්ධයෙන්, විශේෂයෙන් තම ආදරණීයයන් අහිමි වූ පවුල්වලට, නේපාල රජයට සහ ජනතාවට, ශ්‍රී ලංකා රජය සහ ජනතාව වෙනුවෙන්, ජනාධිපතිවරයා සිය හෘදයාංගම ශෝකය පළ කළේය.

ශ්‍රී ලංකාව සහ නේපාලය අතර සමීප සහ දිගුකාලීන මිත්‍රත්වයේ සහ සහයෝගීතාවයේ බැඳීම් සිහිපත් කරමින්, මෙම හදිසි ව්‍යසනයේදී ශ්‍රී ලංකාව, නේපාල ජනතාව සමඟ ශක්තිමත්ව අත්වැල් බැඳගන්නා බව ජනාධිපතිවරයා අවධාරණය කළේය. ගංවතුර සහ නායයෑම්වලින් පීඩාවට පත් ප්‍රජාවන්ට ක්ෂණික සහන සහ මානුෂීය ආධාර සඳහා සහාය වීම මෙම මූල්‍ය දායකත්වයේ අරමුණයි.

අද උදෑසන, විදේශ අමාත්‍ය විජිත හේරත්, නේපාල විදේශ අමාත්‍ය ෂිසිර් ඛනාල් සමඟ සංවාදයක යෙදෙමින්, ශ්‍රී ලංකාවේ ශෝකය, නේපාලය වෙත ලබාදෙන සහය සහ සහයෝගීතාව ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකා රජය, නේපාල රජය සමඟ සමීපව කටයුතු කරන අතර, සහන සහ ප්‍රතිසාධන කටයුතු සඳහා ශ්‍රී ලංකාවට දායක විය හැකි ආකාර ගවේෂණය කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
කොළඹ

2026 අගෝස්තු 27 වැනි දින

**Foreign Affairs**
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
**Republic Building, Colombo 1**
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
✉ cypher@mfa.gov.lk

**Foreign Employment**
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
**17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5**
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5
☎ 2 331 200
✉ info@mfe.gov.lk

**Tourism**
සංචාරක
சுற்றுலாத்துறை
**No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1**
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03, டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு (சர் ராசிக் ஃபரீத் மாவத்தை), கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
✉ secretary@tourismmin.gov.lk